# ධර්මාර්ථ විවරණයෙහිලා සම්භාවිත සතර මහාපදේස හා සූත්‍ර නික්ෂේපණ විධික්‍රමයෙහි පවත්නා අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධතාව පිළිබඳ අධ්‍යයනයක්

කළුගහකොටලේ සුමනසාර හිමි[1]

## හැඳින්වීම

පෙළ, අර්ථකථා හා ටීකා සාහිත්‍ය කෘති පිළිබඳ ව අධ්‍යයනයෙහි දී ධර්මාර්ථ විවරණයෙහි ලා සම්භාවිත විධික්‍රම රැසක් දක්නට ලැබෙන බව පැහැදිලි කරුණකි. ටීකා සාහිත්‍යාන්තර්ගත සූත්‍ර නික්ෂේපණ (සුත්තනික්ඛෙපණ - පාලි) නම් විවරණ ක්‍රමය තත් ධර්මාර්ථ විවරණ ක්‍රම අතර සුවිශේෂී ස්ථානයක් හජනය කරයි. ධර්මාර්ථ විවරණයෙහි ලා එමඟින් ලැබෙන පිටිවහල සුළුපටු නොවේ. එසේ ම ධර්මවිනයෙහි ඉගැන්වෙන සතර මහාපදේස විග්‍රහය සමඟ ද මෙහි යම් ප්‍රතිබද්ධතාවක් තිබෙනු දක්නට ලැබේ. එහෙයින් තත් විෂයානුබද්ධ ව සතර මහාපදේස විග්‍රහය හා සූත්‍ර නික්ෂේපණ විධික්‍රමය අතර පවත්නා අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධතාව ප්‍රකටීකරණය මෙමගින් අභිප්‍රේත ය.

## පර්යේෂණ ක්‍රමවේදය

සතර මහාපදේස විග්‍රහය හා සූත්‍ර නික්ෂේපණ විධික්‍රමය වනාහි පෙළ, අට්ඨකථා හා ටීකා ග්‍රන්ථයන්හි උපයෝජිත විවරණ විධික්‍රමයක් වන හෙයින් මෙහිලා මූලික වශයෙන් ම අවධානය යොමු කෙරෙනුයේ තත් සාහිත්‍යයන් කෙරෙහි ය. සූත්‍ර නික්ෂේපණ විධික්‍රමය පිළිබඳව න්‍යායාත්මක තොරතුරු බහුල වශයෙන් ම ටීකා සාහිත්‍යයෙහි පිළිබිඹු වන හෙයින් මෙහි ලා ඒ පිළිබඳ ව වැඩි අවධානයක් යොමුකෙරේ. සතර මහාපදේස සම්බන්ධයෙන් ද තත්ත්වය එසේම ය. මෙම විධික්‍රමයෙහි න්‍යායාත්මක පසුබිම මෙන් ම ප්‍රායෝගිකත්වය ද ප්‍රදර්ශනය වන්නේ පූර්වෝක්ත සාහිත්‍යයන් ආශ්‍රයෙහි වන හෙයින් තත් සාහිත්‍යාන්තර්ගතය ම මෙහි විෂය පථය බවට පත්වේ. ඊට අමතර ව ධර්මාර්ථ විවරණය පිළිබඳ ප්‍රාමාණික විද්වත් සංකථිකාවන් ද ඇසුරු කරමින් මූලාශ්‍ර පාදක පර්යේෂණයක් වශයෙන් මෙම පර්යේෂණ පත්‍රිකාව රචනා කෙරේ.

---

[1] පාලි දර්ශනපති උපාධි අපේක්ෂක, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
sumanasarak@gmail.com

## ප්‍රතිඵල

පෙළ, අට්ඨකථා හා ටීකා කෘතීන්හි අන්තර්ගත ධර්මාර්ථ විවරණ විධික්‍රම පිළිබඳ ව අවධානය යොමුකිරීමේ දී මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි ප්‍රධාන ධාරණාව වන සූත්‍ර නික්ෂේපණ විධික්‍රමයෙහි ප්‍රායෝගික පසුතලය වැඩිවශයෙන් ම මූර්තිමත් වන්නේ ටීකා සාහිත්‍යය තුළ ය. පෙළ ග්‍රන්ථාගත සූත්‍රේකදේශයන්හි විවිධ නයින් කරන ලද ධර්මාර්ථ විවරණ ක්‍රම දක්නට ලැබුණ ද න්‍යායයික වශයෙන් හෝ නිදර්ශනාත්මක ව කරුණු ගෙනහැර දැක්වීමට ඒ තුළ අවකාශයක් නොමැත. තත් කාර්යය සම්බන්ධයෙන් සුළු වශයෙන් හෝ ඉඩක් ලැබී ඇත්නම් ඒ අර්ථකථා සාහිත්‍යය තුළ ය. එහෙත් ටීකා සාහිත්‍යය වනාහී මෙහි න්‍යායයික හා ප්‍රායෝගිකත්වය ප්‍රකට කිරීම සඳහා සම්භාවිත උරගලක් වශයෙන් හඳුනාගැනීම වරදක් නොවේ. ධර්මාර්ථ විවරණයෙහි ලා ම සම්පාදිත අට්ඨකථා හා ටීකා කෘති අතුරින් සම්බාධකවලින් මිදී වඩාත් විවෘත ලෙස අදහස් දැක්වීමට විවරණකරුවන්ට අවස්ථාව සැලසී ඇත්තේ ටීකා සාහිත්‍යය තුළ ම වීම එයට හේතුව යි.

## සාකච්ඡාව

ධර්ම විනය ලෙස ප්‍රකාශයට පත්වන යම් කරුණක් බුද්ධ වචනය ලෙස භාරගැනීම සඳහා යෝග්‍ය වන්නේ කවර පදනමක් මත ද යන්න පිළිබඳ සාකච්ඡා කිරීම මහාපදේස න්‍යායයෙන් සිදුවේ. කෙසේ නමුදු මෙම න්‍යායය පිළිබඳ ව විමසීමේ දී එය විනය පිටකයේ එක් ආකාරයකටත් සූත්‍ර පිටකයේ තවත් ආකාරයකටත් අට්ඨකථාවන්හි වෙනත් ආකාරයකටත් සඳහන් ව තිබීම විමසිය යුත්තකි.

මෙහි ලා පළමුවෙන් ම විනය පිටකයේ ඉදිරිපත් වන මහාපදේසයන් විමසනු ලැබේ (සමන්තපාසාදිකා, P.T.S 1.180). එහි සඳහන් මහාපදේස සංඛ්‍යාව හතරකි (04).

1. අකප්පිය - අකැප යැයි තහනම් කර නැති දෙය අකැපයට අනුලොම් නම් අකැප ය.
2. අකප්පියානුලෝම - අකැප යැයි තහනම් කර නැති දෙය කැපයට අනුලොම් නම් කැප ය.
3. කප්පිය - කැප යැයි නියම කර නැති දෙය අකැපයට අනුලොම් නම් අකැප ය.
4. අකප්පියාලෝම - කැප යැයි නියම කර නැති දෙය කැපයට අනුලොම් නම් කැප ය.

මෙම මහාපදේසයන් ප්‍රායෝගික ව ක්‍රියාවට නගන්නේ කෙසේද යන්න විමසා බැලීම මෙහි ලා ඉතා වැදගත් වේ. ඒ සඳහා නිදර්ශන පිළිවෙළින් මෙසේ දැක්විය හැකි ය (ඛේමානන්ද හිමි, 1962 : 145).

- භික්ෂූන්ට බයිසිකල් පැදීම අකැප යැයි තහනම් කර නැත. එහෙත් එය අකැපයට අනුලොම් ය. කාය සංවරය නැතිවන හෙයිනි. එහෙයින් එය අකැප ය.
- භික්ෂූන්ට හවසට තේ පානය කිරීම අකැපයැයි තහනම් කොට නැත. එය කැපයට අනුලොම් ය. අෂ්ටපාන චතුමධුර ආදිය වැනි හෙයිනි. එහෙයින් එය කැප ය.
- අතේ ඔරොලෝසු බැඳීම භික්ෂූන්ට නියම කර නැත. එය අකැපයට අනුලොම් ය. මණ්ඩන විභූෂණයක් වන හෙයිනි. එහෙයින් එය අකැප ය.
- අංශකඩයේ ඔරලෝසු පාවිච්චිය නියම කර නැත. එය කැපයට අනුලොම් ය. අවශ්‍ය පිරිකරක් මෙන් වේලාව දැනගැනීමේ උපකරණයක් වන හෙයිනි. එහෙයින් එය කැප ය.

දෙවනු ව විමසා බැලිය යුත්තේ සූත්‍ර පිටකයේ ඉදිරිපත් වන මහාපදේසයන් මොනවාද යන්න යි. ඒවා විනය පිටකයේ මහාපදේශයන්ට සංඛ්‍යාත්මක ව සමාන වුව ද කාරණාකාරණ වශයෙන් වෙනස් ය (දීඝ නිකාය 2, 2006 : 192-196). ඒවා නම්,

1. බුද්ධාපදේස - බුදුරදුන් වෙතින් ඇසූ හෙයින් පිළිගැනීම.
2. සංඝාපදේස - සංඝයාගෙන් ඇසූ හෙයින් පිළිගැනීම.
3. සම්බහුලථෙරාපදේස - බොහෝ තෙරවරුන්ගෙන් ඇසූ හෙයින් පිළිගැනීම.
4. ඒකථෙරාපදේස - එක් තෙර නමකගෙන් ඇසූ හෙයින් පිළිගැනීම.

මෙම මහාපදේශයන්ට අනුව ක්‍රියා කළයුතු ආකාරය විස්තරානුසාරයෙන් පිළිවෙළින් මෙසේ දැක්විය හැකි ය (අංගුත්තර නිකාය 2, 2006 : 330).

- යම් භික්ෂුවක් 'මවිසින් බුදුරදුන් හමුවෙහි අසා පිළිගන්නා ලද ධර්මය මෙය යි. ශාස්තෲ ශාසනය මෙය යි.' යනුවෙන් කියයි නම්, ඒ කීම පිළිනොගෙන බැහැර ද නොකර ඒ පද ව්‍යඤ්ජනයන් සූත්‍රයෙහි බහා බැලිය යුතු ය. විනයෙහි සසඳා බැලිය යුතු ය. ඒ පද ව්‍යඤ්ජන සූත්‍රයෙහි නොබැස සිටී නම් විනයෙහි නොසැසඳේ නම් ඒ ඉගැන්වීම ප්‍රතික්ෂේප කළ යුතු ය. එසේම එකී පද ව්‍යඤ්ජනයන් සූත්‍රයෙහි බැස සිටී නම් විනයෙහි සැසඳේ නම් ඒ ඉගැන්වීම පිළිගත යුතු ය.

- යම් භික්ෂුවක් මවිසින් අසවල් ආවාසයෙහි වෙසෙන ස්ථවිර භික්ෂූන් සහිත සංඝයා හමුවෙහි අසා පිළිගන්නා ලද ධර්මය මෙය යැයි යම් කරුණක් ප්‍රකාශ කෙරේ ද එය ද සූත්‍රයෙහි බහා විනයෙහි සසඳා සත්‍යාසත්‍යතාව නිගමනය කළ යුතු ය.
- යම් භික්ෂුවක් 'මවිසින් අසවල් විහාරයෙහි වෙසෙන බහුශ්‍රැත වූ ආගතාගම වූ ධර්මධර වූ විනයධර වූ මාතිකාධර වූ ස්ථවිර භික්ෂූන් හමුවෙහිදී ධර්ම විනය මෙයයිජ; ශාස්තෘ ශාසනය මෙය යි.' යනුවෙන් අසන ලද බව පවසා ද තත් කාරණය ද සූත්‍ර විනයෙහි බහා සසඳා සත්‍යාසත්‍යතාව නිගමනය කළ යුතු ය.
- යම් භික්ෂුවක් 'මවිසින් අසවල් ආවාසයෙහි වෙසෙන බහුශ්‍රැත වූ ආගතාගම ධර්මධර වූ විනයධර වූ මාතිකාධර වූ එක් භික්ෂුවක් හමුවෙහි ධර්ම විනය මෙය යි; ශාස්තෘ ශාසනය මෙය යි.' යනුවෙන් අසන ලද බව පවසා ද එය ද පෙර නයින් ම විමසා පිළිගැනීම හෝ නොපිළිගැනීම කළ යුතු ය.

තෙවනු ව අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන් විසින් දක්වන ලද චතුර්විධ මහාපදේශයන් පිළිබඳ ව විමසීමක් කළ යුතු ය (සුමංගලවිලාසිනි, P.T.S 2.152). ඒවා නම්,

1. සුත්ත (සූත්‍රයන්හි ඉදිරිපත්වන කරුණු)
2. සුත්තානුලෝම (සූත්‍රයන්හි ඉගැන්වීම්වලට අනුලොම් වූ කරුණු)
3. ආචරියවාද (ආචාර්ය වාදයන්)
4. අත්තනෝමති (ස්වකීය මතය)

මෙහි සූත්‍ර යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ සංගායනාත්‍රයට නැගුණු තුන්පිටකය යි. 'සුත්තානුලොම' යනු කැපයට අනුලෝම වූ කාරණාවන් ය. 'ආචාරියවාද' නම් අට්ඨකථාවන් ය. 'අත්තනොමති' යනු න්‍යායග්‍රාහයෙන් බුද්ධියට අනුව ස්වකීය ප්‍රතිභානයෙන් අවබෝධ කරගත් දෙය යි (සුමංගලවිලාසිනී, P.T.S 2.141). මෙම මහාපදේශයන් සියල්ල ම ආප්ත වශයෙන් නැතහොත් ප්‍රාමාණිකත්වයෙන් ගැනීමක් අට්ඨකථාවන්හි ඉදිරිපත් නොවේ. එහි සඳහන්වන ආකාරයට සූත්‍ර පටිභාහනය (ප්‍රතික්ෂෙප කිරීම) නොකළ යුතු බවත්, යමෙක් එසේ කරන්නේ නම් එසේ කළ හැක්කේ බුදුවරයෙකුට ම පමණක් බවත් අවධාරණය කොට ඇත. අනුලෝම කප්පයේදී යම් කරුණක් සූත්‍රයන්ට සමාන වන්නේ නම් සත්‍ය වශයෙන් ගත යුතු ය. අනෙක්වා නොගත යුතු ය. ආචරියවාදයන් ද සූත්‍රයන් හා සමාන වේ නම් ගතයුතු ය. අනෙක්වා නොගත යුතු බව කියැවේ.

අත්තනොමති නම් මේ සියල්ලට ම වඩා දුර්වල ය. ඒවා ද සූත්‍රයන්ට සමාන වේ නම් ගතයුතු බවත් එසේ නොවන දේ බැහැර කළයුතු බවත් සඳහන් වේ (සුමංගලවිලාසිනි, P.T.S 2.141).

සූත්‍ර නික්ෂේපණය පිළිබඳ මූලබීජ ප්‍රථම වරට හමුවන්නේ සූත්‍ර හා විනය පෙළ ග්‍රන්ථයන්හි ය. කෙසේනමුදු අපගේ මූලික ප්‍රස්තුතය වන සූත්‍ර නික්ෂේපය ද චතුර්විධ ය. එනම්, අත්තජ්ඣාස, පරජ්ඣාස, පුච්ඡාවසික හා අට්ඨුප්පත්තික යනුවෙනි. බුද්ධ දේශනාවෙහි ඉදිරිපත්වන ඇතැම් සූත්‍ර ධර්ම ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ දෙවියෙකුගේ හෝ මාරයෙකුගේ හෝ බ්‍රහ්මයෙකුගේ හෝ ලොව කිසිවකුගේ හෝ බලපෑමකින්, ආරාධනාවකින් තොර ව හුදෙක් බුදුන් වහන්සේ විසින් ස්වකීය අපේක්ෂාවෙන් ම දේශනා කරන ලද ඒවා ය. නිදර්ශන වශයෙන් මහාසතිපට්ඨාන සූත්‍රය, ආකඞ්ඛෙය්‍ය සූත්‍රය, මහාසළායතනවිභඞ්ග සූත්‍රය, අරියවංස සූත්‍රය හා සම්මප්පධාන සූත්‍රය ආදිය දැක්විය හැකි ය. අත්තජ්ඣාස යනුවෙන් හැඳින්වෙන්නේ පූර්වෝක්ත ලක්ෂණවලින් සමුපලක්ෂිත දේශනාවන් ය. එසේම ඇතැම් දේශනාවන් අන්‍යයන්ගේ ඉවසීම, චිත්ත ස්වභාවය, හේතු සම්පත්තිය හා අවබෝධයේ තරම උපපරීක්ෂණය කොට සිදුකරන ලද ඒවා වෙති. නිදර්ශන වශයෙන් චූළරාහුලෝවාද සූත්‍රය, මහාරාහුලෝවාද සූත්‍රය, ධම්මචක්කප්පවත්තන සූත්‍රය හා ධාතුවිභඞ්ග සූත්‍රය ආදිය දැක්විය හැකි ය. මෙම ලක්ෂණ ප්‍රකට කරන සූත්‍ර ධර්ම අධ්‍යාසමය වශයෙන් පරජ්ඣාස නම් වේ. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසෙහි කෙනෙක් විසින් හෝ නාග, සුපර්ණ, ගාන්ධර්ව, අසුර, යක්ෂ, මහාරාජ, තාවතිංස දේව හා බ්‍රහ්මාදී කෙනෙක් විසින් විචාරන ලදුව කරන ලද දේශනාවන් ද සූත්‍රාන්තරයෙහි විද්‍යමාන ය. නිදර්ශන වශයෙන් බොජ්ඣඞ්ග සූත්‍ර, දේවතා සංයුත්ත, මාර සංයුත්ත, බ්‍රහ්ම සංයුත්ත, සක්ක සංයුත්ත, චූළවේදල්ල සූත්‍රය, මහාවේදල්ල සූත්‍රය, සාමඤ්ඤඵල සූත්‍රය හා ආළවක සූත්‍රය ආදිය දැක්විය හැකි ය. පූර්වෝක්ත ලක්ෂණානුලක්ෂණවලින් සුපරිපෝෂිත දේශනාවන් පුච්ඡාවසික ගණයට අයත් වේ. ඉහත දක්වන ලද ත්‍රිවිධාකාරයෙන් තොර ව ඒ මොහොතේ එළඹෙන ලද සිද්ධි හෝ අවස්ථා පාදක ව කරන ලද දේශනාවන් රැසක් බුද්ධ වචනය තුළ අන්තර්ගත ය. ධම්මදායාද, චූළසීහනාද, චන්දූපම, පුත්තමංසූපම, දාරුක්ඛන්ධූපම, අග්ගික්ඛන්ධූපම, වේණපිණ්ඩූපම, පාරිජත්තකූපම වැනි සූත්‍ර ධර්ම නිදර්ශන වශයෙන් දැක්විය හැකි ය. මෙවැනි දේශනාවන් අට්ඨුප්පත්තික දේශනාවන් ලෙස හැඳින්වෙයි.

එසේ ම මෙහි ස්වකීය මතය පිළිබඳ සත්‍යෝක්ෂණය සඳහා අන්‍ය අදහස් විචාරීම සමඟ ප්‍රතිබද්ධතාවක් වේ. ඒ අනුව තම අදහස හා අන්‍ය අදහස විමසීම මඟින් තම අදහස නිර්ණය කිරීමත්, අන් අදහස හා අර්ථෝත්පත්තිය විමසීම මඟින්

සත්‍යාසත්‍යක්ෂණය යනුවෙන් මෙය ද්විප්‍රභේදගත වෙයි. මේ අනුව සූත්‍ර නික්ෂේපණය නැවත තදන්තර්ගතතා (තදන්තොගදත්තා), සම්භවන්ත, ශේෂනික්ෂේප (සෙසනික්ඛෙප) හා මූලනික්ෂේප (මූලනික්ඛෙප) යනුවෙන් සිව් වැදෑරුම් වේ.

## සමාලෝචනය

සතර මහාපදේශයන් පිළිබඳ වූ අවස්ථා ත්‍රය විමසීමේ දී විනය පිටකයේ ඉදිරිපත් වන අපදේශයන් හතර ම ආප්තයන් හෙවත් ප්‍රමාණයන් වශයෙන් ගතහැකි බව පැහැදිලි ය. එහෙත් සූත්‍රපිටකයෙහි ඉදිරිපත්වන කරුණු හතර ම ආප්ත වශයෙන් නොගත යුතු බව කිව යුතු ය. පුද්ගලයන් විසින් එකී කාරණාවන් ආප්ත වශයෙන් ගන්නා බවත් එහෙත් ඒවා වීමංසනයෙන් තොරව නොගත යුතු බවත් අවධාරණය කොට ඇත. ඒවා පිළිගන්නේ නම් පිළිගත යුත්තේ ද නොපිළිගන්නේ නම් නොපිළිගත යුත්තේ ද සූත්‍රයෙහි බහා විනය හා සැසඳීමෙන් අනතුරුව ය. අර්ථකථාවන්හි ඉදිරිපත් වූ ප්‍රථම කාරණය, එනම් සූත්‍ර ප්‍රාමාණිකත්වය නිසැකව ම ආප්තයක් වශයෙන් ගත හැකි ය. අනෙක් කරුණු ත්‍රිත්වය ධර්ම විනය හා ගැළපීමෙන් අනතුරුව සත්‍යාසත්‍ය නිගමනයන්ට එළඹිය යුතු ය.

එසේ ම සූත්‍ර නික්ෂේපණයේ දී ද සතර මහාපදේස පිළිබඳ ව අවධානය යොමුකොට ඇති බව අත්තජ්ඣාස හා පරජ්ඣාස සම්බන්ධයෙන් කෙරෙන විග්‍රහයන්ගෙන් පැහැදිලි වේ. මේ සියලු කාරණා පිළිබඳ විමසීමේ දී පැහැදිලි වන්නේ සතර මහාපදේස විග්‍රහය හා සූත්‍ර නික්ෂේපණය යනු එකිනෙකට වියුක්ත ධර්ම විවරණ මාර්ග නොවන බවත් සතර මහාපදේස විග්‍රහයෙහි ම දිගුවක් වශයෙන් සූත්‍ර නික්ෂේපණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් ව ඇති බවත් ය. තව ද මෙම අවස්ථා සියල්ලක දී ම ධර්මය ම ආප්තය වශයෙන් පිළිගෙන ඇති බවත් මෙහි ලා කිවයුතු ය.

ප්‍රමුඛ පද :- ධර්මාර්ථ, සූත්‍ර නික්ෂේපණය, චතුර්විධ මහාපදේශ, ආප්ත

## ආශ්‍රිත ග්‍රන්ථ

*දීඝනිකාය* II. (2006). දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
*සමන්තපාසාදිකා.* (1929). කොළඹ : ත්‍රිපිටක මුද්‍රණාලය.
*සුමංගලවිලාසිනී.* (1929). කොළඹ : ත්‍රිපිටක මුද්‍රණාලය.
ඛේමානන්ද හිමි, හැගොඩ. (1962). *ථෙරවාද න්‍යාය.* කොළඹ : මංගල මුද්‍රණාලය.
*Chaṭṭha Saṃgāyanā* CD Rom 4.0., India : Vipassanā Research Institute.